පුවත් වාර්තාකරණයේදී හා ලිපි පළ කිරීමේදී, හැකි සෑම අවස්ථාවකදීම පුවතට අදාළ සියලු පාර්ශවයන්ගෙන් තොරතුරු විමසා මනා සමබරතාවයකින් යුතුව වාර්තා කිරීම වඩාත් ආචාර ධාර්මික වේ. එතුළින් එම පුවත වඩාත්ම නිරවද්‍ය ලෙස ග්‍රහණය කරගැනීමට පාඨකයාට ද හැකියාව ලැබේ. මේ පිළිබඳ විසින් මින් පෙර අවස්ථා කිහිපයකදීම සාකච්ඡා කොට තිබුණෙමු.

පෙබරවාරි 02, 2022 දින දිවයින පුවත්පතෙහි "කප්පම්වලට යටවී යළි වැළලෙන මුහුදු මහා විහාරය" යන සිරස්තලයෙන් පළ වූ ලිපිය ඊට උදාහරණයකි. මෙම ලිපියේ පොතුවිල් මුහුදු මහා විහාර භූමි ප්‍රදේශය හා බැඳුනු ගැටලු පිළිබඳව සාකච්ඡා වී ඇත. එහිදී එම විහාරයට "මුසල්මානුවන්" අතින් ඓතිහාසිකව සිදුවූ "අඩන්තේට්ටම්" පිළිබඳව ද පුළුල්ව සාකච්ඡා කොට තිබුණි.
මෙම ලිපියෙහි, "ඉන්පසු අනූව දශකයේ දී තවත් අක්කර නවයක් මුසල්මානුවන්ගේ ග්‍රහණයට ලක්වී තිබුණේ පළාතේ දේශපාලඥයින් හා මුස්ලිම් ප්‍රාදේශීය ලේකම්වරයන්ගේ අනුග්‍රගයෙනි", "අලුතෙන් මාවතක් ඉදිවී විහාරස්ථානය සංවර්ධනය වීම නිසා කෝපයට පත් මුසල්මානුවන් යළිත්වරක් සංවිධානය වී ආවාස ගෙයට ගිනි තබන ලදි" යනාදී තොරතුරු දැක්වීම් ඉදිරිපත් කර තිබිණි.

1) මෙම ලිපිය තුළින්ද පැහැදිලි වන්නේ, කාලයක් පුරාවට පැවත එන මෙම ගැටළුවේ පාර්ශව කිහිපයක්ම ඇති බවයි. එසේ නම්, මෙම ලිපියේ ඇති ඇතැම් කරුණු සනාථ කරගැනීම සඳහා මෙන්ම ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීම සඳහා, එහි චෝදනා එල්ල කෙරෙනා පාර්ශවයන් සම්බන්ධ කර ගැනීමට හැකියාවක් නොතිබුණිද? හැකියාවක් නොතිබුණේ නම්, ඒ සම්බන්ධයෙන් ලිපිය තුළ සඳහන් කිරීම වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

2) එසේ, මෙම ගැටළුවට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන්ගෙන්ද කරුණු විමසීමට උත්සාහ ගත්තේ නම්, මෙම ලිපිය වඩාත් සම්පූර්ණ නොවන්නේද?

ඔබේ අදහස කුමක්ද?